1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2023.06.28 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හාර කෝටි තිස් හත් ලක්ෂ තිස් දහස් අටසිය විසි හතයි ශත තිස් තුනක (රු. 43,730,827.33) සහ ඇමෙරිකා එක්සත් ජනපද වලංගු මුදලින් එක්සත් ජනපද ඩොලර් එක් ලක්ෂ අනූ දෙදහස් දෙසිය තිස් පහයි ශත විසි නවයක (USD 192,235.29) මුදල ද, 2023.05.26 දින සිට අංක 3255, 3257 සහ 3259 උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දෙකෝටි විසි හය ලක්ෂ හැත්තෑ හතර දහස් නවසිය දහසයයි ශත තිස් අටක (රු. 22,674,916.38) මුදලක් සඳහා at the rate of Monthly Average Weighted Prime Lending Rate (AWPLR) + Three Per centum (3%) per annum , රුපියල් අනූ හත් ලක්ෂ අසූ හතර දහස් අටසිය දහ තුනයි ශත හැත්තෑ හතරක (රු. 9,784,813.74) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහයි දශම අටක් (5.8%) සහ ඇමෙරිකා එක්සත් ජනපද වලංගු මුදලින් එක්සත් ජනපද ඩොලර් එක් ලක්ෂ අසූ පන් දහස් අනූ හතක (USD 185,097.00) at the rate of 3 months London Inter Bank Offered Rate + Four per centum (LIBOR + 4%) per annum හා තවත් රුපියල් හැත්තෑ නව ලක්ෂ අනූ තුන් දහස් තුන්සිය විසි හයයි ශත අසූ පහක (රු. 7,993,326.85) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම දෙකයි පහක් (12.25%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2023.08.11 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* සහ 2023.08.11 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි,

**2024.02.16** වැනි දින ප.ව. 2.15ට,

පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සාරකෙත හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් පාලනය කිරීමෙහි නිරත පුද්ගලයා මෙන්ම එහි තත්‍යසම *නොහොත්* නියම අයිතිකරු දොන් ප්‍රසන්න ඩැරල් හෙට්ටිආරච්චි වන වා සේම එකී සමාගමේ කළමනාකාරීත්වයේ සහ පාලනය කිරීමේ නිරත සාරකෙත හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂ වශයෙන් එකී දොන් ප්‍රසන්න ඩැරල් හෙට්ටිආරච්චි නියැලෙන අතර ඒ අනුව, දොන් ප්‍රසන්න ඩැරල් හෙට්ටිආරච්චි සිදුකළ සහ සමාගම සමග එළඹුන සියළුම සාමාන්‍ය සාකච්ඡා කටයුතු සහ සියළුම ගනුදෙනු, සියළුම ණය ගැනීම්, ඒවා ගෙවීමට ඇති වගකීම් සහ ඒවා පැහැරහැරීම් පිළිබඳවත්, අවබෝධය මෙන්ම දැනුම ඇති පුද්ගලයා ද වන අතර සම්පත් බැංකුව පීඑල්සී මගින් සාරකෙත හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කරන ලද මූල්‍ය අනුග්‍රහයන් හි නිසි ප්‍රතිලාභියා එකී දොන් ප්‍රසන්න ඩැරල් හෙට්ටිආරච්චි වන හෙයින් ද,

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහා නගර සභා සීමාවන් තුළ සහ කඩුවෙල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ කුමාරගේවත්ත, අංක 479 D දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ තලංගම දකුණ පිහිටි පැලවත්ත - හෝකන්දර පාර, වරිපනම් අංක 264 දරන "ගල්බොඩවත්ත *නොහොත්* අකුරේගොඩවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. පී. චන්ද්‍රසේකර විසින් සාදන ලද 2003.09.18 දින හා අංක 1371 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් $C2^{A}$ වශයෙන් ලකුණු කොට

ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : කේ. ඒ. පෙරේරා සහ සී. බෙලිංගේ අංක 10833 දරන පිඹුරේ ලොට් B, නැගෙනහිරට : මෙම පිඹුරේ ලොට් C2C සහ C2B, දකුණට: ඩබ්ලිව්. ඒ. එමිස් පෙරේරා අංක 10833 දරන පිඹුරේ ලොට් D සහ බස්නාහිරට : ඩබ්ලිව්. ඒ. පෙරේරා, අංක 82 දරන පිඹුරේ ලොට් C1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිහක් (පර්. 30) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1371 දරන පිඹුරට අනුව ය.

එකී ලොට් $C2^{A}$ පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

1. එකී තලංගම දකුණ පිහිටි "ගල්බොඩවත්ත *නොහොත්* අකුරේගොඩවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ඩී. බෙල්ලන විසින් සාදන ලද 1998 දෙසැම්බර් 28 දින හා අංක 539/98 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් $C2^{A}$ වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : කේ. ඒ. පෙරේරා සහ සී. බෙලිංගේ අංක 10838 දරන පිඹුරේ ලොට් B, නැගෙනහිරට: මෙහි ලොට් C2B, දකුණට : ඩබ්ලිව්. ඒ. එමිස් පෙරේරා අංක 10833 දරන පිඹුරේ ලොට් D සහ බස්නාහිරට: ඩබ්ලිව්. ඒ. පෙරේරා අංක 82 දරන පිඹුරේ ලොට් $C^{1}$ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිහක් (පර්. 30) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 539/98 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව B 837/131 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. එකී තලංගම දකුණ පිහිටි පැලවත්ත හෝකන්දර පාර, වරිපනම් අංක 264 දරන "ගල්බොඩවත්ත *නොහොත්* අකුරේගොඩවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. පී. චන්ද්‍රසේකර විසින් සාදන ලද 2003.09.22 දින හා අංක 1372 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : බලයලත් මානක තැන කේ. පී. චන්ද්‍රසේකර විසින් සාදන ලද අංක 1371 දරන පිඹුරේ ලොට් C2C, නැගෙනහිරට : පැලවත්ත සිට හෝකන්දර දක්වා පාර සහ මෙහි ලොට් 2, දකුණට : ඩබ්ලිව්. ඒ. එමිස් පෙරේරා අංක 10833 දරන පිඹුරේ ලොට් D සහ බස්නාහිරට : බලයලත් මානක තැන කේ. පී. චන්ද්‍රසේකර විසින් සාදන ලද අංක 1371 දරන පිඹුරේ ලොට් C2A යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම තුනයි එකක් (පර්. 16.31) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1372 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව B 1025/119 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන කේ. පී. චන්ද්‍රසේකර යන අය විසින් සාදන ලද 2003.09.18 අංක 1371 දරන පිඹුරේ ලොට් C2 දිගේ හා ඒ මතින් යටින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද ඒ හා බැඳුණ වෙනත් අයිතීන් ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

01 - 410

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

මෙම දේපළ රොක්සිස් ෆාම් ව්‍යාපාරයේ හවුල්කරුවන් වන බැස්තියන් කෝරළලාගේ සිප්රිනාස් රොෂාන් ඩැනියෙල් රොද්‍රිගෝ වීරසිංහ ගුණවර්ධන, බැස්තියන් කෝරළලාගේ රජින්ද්‍ර ඉන්දික රොද්‍රිගෝ වීරසිංහ ගුණවර්ධන සහ බැස්තියන් කෝරළලාගේ රෝෂිත ජයමාල් රොද්‍රිගෝ

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් මහතෙල්ගේ සජානි කැමීලියා පීරිස් විසින් සහතික කරන ලද අංක 1263 සහ 2018 ජූලි මස 25 දින උකස් බැඳුම්කරය මගින්, ඉහත කී බැස්තියන් කෝරළලාගේ සිප්රිනාස් රොෂාන් ඩැනියෙල් රොද්‍රිගෝ වීරසිංහ ගුණවර්ධන, බැස්තියන් කෝරළලාගේ රජින්ද්‍ර ඉන්දික රොද්‍රිගෝ වීරසිංහ ගුණවර්ධන සහ බැස්තියන් කෝරළලාගේ රෝෂිත ජයමාල් රොද්‍රිගෝ යන අය විසින් ලබාගත් මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන්, බන්ධනදායින් ලෙස ක්‍රියාකරමින් ඉහත කී බැස්තියන් කෝරළලාගේ සිප්රිනාස් රොෂාන් ඩැනියෙල් රොද්‍රිගෝ වීරසිංහ ගුණවර්ධන, බැස්තියන් කෝරළලාගේ රාජින්ද්‍ර ඉන්දික රොද්‍රිගෝ වීරසිංහ ගුණවර්ධන සහ බැස්තියන් කෝරළලාගේ රෝෂිත ජයමාල් රොද්‍රිගෝ යන අය විසින් සහ උකස්කරු ලෙස ක්‍රියාකරමින් ඉහත කී බැස්තියන් කෝරළලාගේ සිප්රිනාස් රොෂාන් ඩැනියෙල් රොද්‍රිගෝ වීරසිංහ ගුණවර්ධන යන අය විසින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වෙන අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ 02, යූනියන් පෙදෙසේ, අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන් පීඑල්සී නමින් උකස් කොට, ඇපයට තබා ඇති බැවින් ද, එකී බැඳුම්කරය මගින් ඇප තබන ලද ඉහත කී මූල්‍ය පහසුකම් ගෙවා පියවා දැමීම ඉහත කී බැස්තියන් කෝරළලාගේ සිප්රිනාස් රොෂාන් ඩැනියෙල් රොද්‍රිගෝ වීරසිංහ ගුණවර්ධන, බැස්තියන් කෝරළලාගේ රාජින්ද්‍ර ඉන්දික රොද්‍රිගෙ ෝ වීරසිංහ ගුණවර්ධන සහ බැස්තියන් කෝරළලාගේ රෝෂිත ජයමාල් රොද්‍රිගෝ යන අය විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව,

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළයේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ පමුණුගම උපකාර්යාලයේ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 167 දරන උස්වටකෙයියාව ග්‍රාම නිලධාරී වසමේ අංක 7 දරන නාගරික කොට්ඨාසයේ උස්වැටකෙයියාවේ පිහිටි ෆාතිමා මාවතේ වරිපනම් අංක 08 දරන මාදන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 15630 සහ 1997 අගෝස්තු මස 30 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 3 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටසට මායිම් : උතුරට : ෆාතිමා පාර ද, නැගෙනහිරට : එම්. රොද්‍රිගෝ යන අයගේ එම ඉඩමේ කොටසක් ද, දකුණට : වර්තමානයේ ලංකා ඔරික්ස් ලීසිං සමාගමේ ඉඩම ද, බස්නාහිරට : දිලිප් ජයමාන්න යන අයගේ ඉඩම ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 15630 දරන පිඹුර අනුව රූඩ් එකකුත් පර්චස් දහ අටයි දශම හතරයි බිංදුවක් (රූ. 1, පර්. 18.40) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි සෑම

සියලු දේත් සමඟ වන අතර, මෙම දේපළ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L 362/66 දරන වෙළුමේ/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත. ඉහත සඳහන් දේපළ,

**2024 ක් වූ පෙබරවාරි මස 13 වැනි දින ප.ව. 2.30 ට,**

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම* .- පමුණුගම මංසන්ධියේ සිට කොළඹ පාර ඔස්සේ කි.මී. 1.4 ක් පමණ දුරක් ගොස් **TT** මංසන්ධිය දක්වා පැමිණ වම් පසට ඇති මාර්ගයට හැරී තවත් කි.මී. 4.5 ක පමණ දුරක් ගිය විට වම් පසින් පිහිටි ෆාතිමා පාරට හැරී තවත් මීටර් 25 - 30 ක පමණ දුරක් ගිය විට අදාළ දේපළ මාර්ගයේ දකුණු පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* : සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

01. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
02. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% ක් (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්),
04. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 7,500/-,
05. ලිපිකරු හා සෝෂක වේතන රු. 2,500/-,
06. සියලුම ප්‍රචාරක වියදම්,
07. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද සමඟ වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දනටමත් ගෙවා ඇති ගැනුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

*අතිකුත් තොරතුරු සඳහා විමසන්න* :

නීති දෙපාර්තමේන්තුව,
නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී.,
කළමනාකරු,
අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.
දුරකතන අංකය : 011 4218742.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
බලයලත් වෙන්දේසිකරු සහ
උසාවි කොමසාරිස්.

අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකතන අංක : 011 3068185, 011 2572940.

01 - 380

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

මෙම දේපළ "ගැමා ප්ලාස්ටික් ඉන්ඩස්ට්‍රීස්" යන නාමය විලාසය සහ අභිධානය යටතේ තනි හිමිකාර ව්‍යාපාරයක් පවත්වාගෙන යන බෙන්සිල් කාලින්ද කන්දේ ගමගේ *නොහොත්* බෙන්සිල් කාලින්ද කන්දේගමගේ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජූලියන් හෙට්ටිආරච්චිගේ ලසන්ත සංජීව සෙනවිරත්න විසින් සහතික කරන ලද අංක767 සහ 2021 නොවැම්බර් මස 25 දින දරන උකස් බැඳුම්කරය මගින්, ඉහත කී බෙන්සිල් කාලින්ද කන්දේ ගමගේ, *නොහොත්* බෙන්සිල් කාලින්ද කන්දේගමගේ යන අය විසින් ලබාගත් මූල්‍ය පහසුකම් නිසි පදිරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් බන්ධනදායී/උකස්කරු ලෙස ක්‍රියාකරමින් ඉහත කී බෙන්සිල් කාලින්ද කන්දේගමගේ *නොහොත්* බෙන්සිල් කන්දේගමගේ යන අය විසින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වෙන අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ 02, යූනියන් පෙදෙසේ, අංක.242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමින් උකස් කොට, ඇපයට තබා ඇති බැවින් ද, එකී බැඳුම්කර මගින් ඇප තබන ලද ඉහත කී මූල්‍ය පහසුකම් ගෙවා පියවා දැමීම ඉහත කී බෙන්සිල් කාලින්ද කන්දේ ගමගේ *නොහොත්* බෙන්සිල් කාලින්ද කන්දේගමගේ යන අය විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව,

1. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර පස්දුන් කෝරළයේ ගගබොඩ පත්තුවේ බුලත්සිංහල ප්‍රාදේශීය සභා සීමාවේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ අංක 814 දරන උතුරු ගෝවින්න ග්‍රාම නිලධාරි වසමේ ගෝවින්නේ පිහිටි ගෝවින් මානන, ඉදල්හේන සහ මානනනැකට්ටිය නමැති ඒකාබද්ධ කළ ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. ඒ. එන්. පුෂ්පකුමාර විසින් මැන සාදන ලද අංක 1432 සහ 2018 ජුනි මස 06 දින දරන පිඹුරේ නිරූපිත ලොට් A1 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටසට මායිම් : උතුරට : මෙම ඉඩමේ ලොට් 2 (අංක 3321 දරන පිඹුරේ නිරූපිත) ද, නැගෙනහිරට : ලොට් A2 සහ ලොට් A3 (මීටර් 4 ක් පළල පාර සඳහා වෙන් කිරීම) ද, දකුණට : ලොට් A3 (මීටර් 4 ක් පළල පාර සඳහා වෙන් කිරීම) ද,සහ මෙම ඉඩමේ ලොට් C ද, බස්නාහිරට : ෆ්‍රෝසෙස්ටර් වතු යාය ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1432 දරන පිඹුර අනුව පර්චස් තිස් එකයි දශම අටයි හතක් (පර්. 31.87) *නොහොත්* හෙක්ටයාර් 0.0806 ක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, පලතුරු ආදී සෑම සියලු දේත් සමඟ වන අතර, මෙම දේපළ මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 97/122 දරන වෙළුම/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර පස්දුන් කෝරළයේ, ගගබොඩ පත්තුවේ, බුලත්සිංහල ප්‍රාදේශීය සභා සීමාවේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ අංක 814 දරන උතුරු ගෝවින්න ග්‍රාම නිලධාරි වසමේ ගෝවින්නේ පිහිටි ගෝවින් මානන, ඉදල්හේන සහ මානනනැකට්ටිය නමැති ඒකාබද්ධ කළ ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. ඒ. එන්. පුෂ්පකුමාර විසින් මැන සාදන ලද අංක 1432 සහ 2018 ජුනි මස 06 දින දරන පිඹුරේ නිරූපිත ලොට් A2 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 2 (අංක 3321 දරන පිඹුරේ නිරූපිත) , නැගෙනහිරට : ගෝවින්න සිට වරකාගොඩ දක්වා ඇති පාර ද, දකුණට : මෙම පිඹුරේ ලොට් A3 (මීටර් 4 ක් පළල පාර සඳහා වෙන් කිරීම) ද, බස්නාහිරට : මෙම පිඹුරේ ලොට් A1 ද යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1432

දරන පිඹුර අනුව පර්චස් තිස් එකයි දශම අටයි හතක් (පර්. 31.87) *නොහොත්* හෙක්ටයාර් 0.0806 ක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, පලතුරු ආදී සෑම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 97/30 දරන වෙළුම/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත.

තවද, ඉහත කී ඉඩමට මෙහි පහත සවිස්තරව දැක්වෙන ඉඩමේ පාර සඳහා වෙන් කළ බිම් කොටසෙන් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමගය.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර පස්දුන් කෝරළයේ, ගඟබොඩ පත්තුවේ, බුලත්සිංහල ප්‍රාදේශීය සභා සීමාවේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ අංක 814 දරන උතුරු ගෝවින්න ග්‍රාම නිලධාරි වසමේ ගෝවින්න පිහිටි ගෝවින්න මානන, ඉදල්හේන සහ මානනනැකට්ටිය නමැති ඒකාබද්ධ කළ ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. ඒ. එන්. පුෂ්පකුමාර විසින් මැන සාදන ලද අංක 1432 සහ 2018 ජූනි මස 06 දින දරන පිඹුරේ නිරූපිත ලොට් A3 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටසට මායිම්, උතුරට : මෙම පිඹුරේ නිරූපිත ලොට් A1 සහ ලොට් A2 ද, නැගෙනහිරට : ගෝවින්න සිට වරකාගොඩ දක්වා ඇති පාර ද, දකුණට : මෙම ඉඩමේ ලොට් C ද, බස්නාහිරට : මෙම පිඹුරේ නිරූපිත ලොට් A1 ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1432 දරන පිඹුර අනුව පර්චස් අටයි දශම දෙකයි දෙකක් (පර්. 8.22) *නොහොත්* හෙක්ටයාර් 0.0208 ක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, පලතුරු ආදී සෑම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 97/124 දරන වෙළුම/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත. ඉහත සඳහන් දේපළ

**2024 පෙබරවාරි මස 14 වැනි දින පෙ.ව. 10.30 ට,**

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දෙසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම* .- හොරණ බස්නැවතුම්පොලේ සිට කලවැල්ලාව හරහා දිවෙන මතුගම පාර ඔස්සේ කි.මී 8 ක පමණ දුරක් ගොස් ගෝවින්න මංසන්ධිය දක්වා පැමිණ වම් පසට ඇති වරකාගොඩ පාරට හැරී තවත් මීටර් 500 ක පමණ දුරක් ගොස් රණසිංහගොඩ පාර, මංසන්ධිය සහ ගෝවින්න මහ විද්‍යාලය දක්වා පැමිණි විට අදාළ දේපළ මාර්ගයේ දකුණු පසින් ගෝවින්න මහා විද්‍යාලය ඉදිරිපසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* : සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

01. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
02. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% ක් (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්),
04. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 7,500/-,
05. ලිපිකරු හා සෝෂක වේතන රු. 2,500/-,
06. සියලුම ප්‍රචාරක වියදම්,
07. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

*අනිකුත් තොරතුරු සඳහා විමසන්න* :

කළමනාකරු,
නීති දෙපාර්තමේන්තුව,
නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී.,
අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.
දුරකතන අංකය : 011 4218742.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

එම්. එච්. ටී. කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු සහ
උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකතන අංක : 011 3068185, 011 2572940.

01 - 381

---

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

මෙම දේපළ එදිරිසිංහ ආරච්චිලාගේ සරත් සිසිර කුමාර එදිරිසිංහ කුලියාපිටිය ප්‍රසිද්ධ නොතාරිස් දෙමින්ගු විතානගේ ධම්මිනි රුක්මාල් අංගම්මන විසින් සහතික කරන ලද අංක 6219 සහ 2016 ජනවාරි මස 21 දින දරන උකස් බැඳුම්කරය සහ එම නොතාරිස් විසින් සහතික කරන ලද අංක 6658 සහ 2018 මැයි මස 10 දින දරන උකස් බැඳුම්කරය මගින්, ඉහත කී එදිරිසිංහ ආරච්චිලාගේ සරත් සිසිර කුමාර එදිරිසිංහ යන අය විසින් ලබාගත් මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන්, බන්ධනදායී/උකස්කරු ලෙස ක්‍රියාකරමින් ඉහත කී එදිරිසිංහ ආරච්චිලාගේ සරත් සිසිර කුමාර එදිරිසිංහ යන අය විසින් මෙහි පහත පළමුවන උපලේඛනයේ සහ දෙවන උපලේඛනයේ සවිස්තරව දැක්වෙන අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ 02, යුනියන් පෙදෙසේ, අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමින් උකස් කොට, ඇපයට තබා ඇති බැවින් ද,

එකී බැඳුම්කරය මගින් ඇප තබන ලද ඉහත කී මූල්‍ය පහසුකම් ගෙවා පියවා දැමීම ඉහත කී එදිරිසිංහ ආරච්චිලාගේ සරත් සිසිර

කුමාර එදිරිසිංහ යන අය විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව,

### 1 වන වෙන්දේසිය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දකුණු යටිකහ කෝරළයේ, කටුගම්පොල හත්පත්තුවේ, කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසයේ, බටහිර කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බිහල්පොල ග්‍රාම නිලධාරී වසමේ බිහල්පොල පිහිටි කඩේවත්ත වශයෙන් දන්නා සහ හඳුන්වන ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඒ. එන්. ගුණසිරි විසින් මැන සාදන ලද අංක 7715 සහ 2013.07.22 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 04 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටසට මායිම්, උතුරට : අංක 7715 දරන පිඹුරේ නිරූපිත ලොට් 03 ද, නැගෙනහිරට : මුතුගල සිට බිහල්පොල දක්වා වැටී ඇති ප්‍රධාන පාර ද, දකුණට : අංක 7715 දරන පිඹුරේ නිරූපිත ලොට් 05 ද, බස්නාහිරට : අංක 7630 දරන පිඹුරේ නිරූපිත ලොට් 04 සහ දෙවට පාර ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් තිස් අටයි දශම දෙකක් (පර්. 38.2) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි සෑම සියලු දේත් සමඟ වන අතර, මෙම දේපළ කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 19/131 යටතේ ලියාපදිංචි කර ඇත. ඉහත සඳහන් දේපළ,

**2024 පෙබරවාරි මස 13 වැනි දින පෙ.ව. 10.30ට,**

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම* .- නාරම්මල නගරයේ සිට කුලියාපිටිය පාර ඔස්සේ කි.මී. 8 ක පමණ දුරක් ගොස් බිහල්පොල මංසන්ධිය දක්වා පැමිණ වම්පසට ඇති මුතුගල පාරට හැරී තවත් මීටර් 350 ක පමණ දුරක් ගිය විට අදාළ දේපළ මාර්ගයේ දකුණු පසින් පිහිටා ඇත.

### 2 වන වෙන්දේසිය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දකුණු යටිකහ කෝරළයේ, කටුගම්පොල හත්පත්තුවේ, කුලියාපිටිය නගර සභා සීමාවේ අංක 02 දරන නාගරික කොට්ඨාසයේ, බටහිර කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුලියාපිටිය නගරය ග්‍රාම නිළධාරී වසමේ, කුලියාපිටිය ගමේ පිහිටි ආනන්දගිරි ගාඩ්න් වශයෙන් දන්නා සහ හඳුන්වන ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඒ. එම්. සී. බණ්ඩාර විසින් මැන සාදන ලද අංක 6551 සහ 2018.01.18 දින දරන පිඹුර නිරූපිත ලොට් 01 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටසට මායිම් : උතුරට : බලයලත් මිනින්දෝරු එච්. ඒ. එම්. සී. බණ්ඩාර විසින් මැන සාදන ලද අංක 1088 සහ 1994 අගෝස්තු මස 06 දින දරන පිඹුරේ නිරූපිත, වර්තමානයේ (නගර සභා) පාරක් වන ලොට් 05 ද, නැගෙනහිරට : කලින් පාරක් වන සහ බලයලත් මිනින්දෝරු එච්. ඒ. එම්. සී. බණ්ඩාර විසින් මැන සාදන ලද අංක 1088 සහ 1994 අගෝස්තු මස 06 දින දරන පිඹුරේ නිරූපිත, වර්තමානයේ (නගර සභා) පාරක් වන ලොට් 4B ද, දකුණට : ඩී. එම්. පී. දිසානායක, තෙන්නකෝන් සහ දිසානායකගේ උරුමක්කාරයන් විසින් හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු එච්. ඒ. එම්. සී. බණ්ඩාර විසින් මැන සාදන ලද අංක 1088 සහ 1994 අගෝස්තු මස 06 දින දරන පිඹුරේ නිරූපිත, වර්තමානයේ කළුආරච්චි විසින් හිමිකම් කියන ලොට් 3 ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහහතයි දශම දෙකක් (පර්. 17.2) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි සෑම සියලු දේත් සමඟය. ඉහත සඳහන් දේපළ,

**2024 පෙබරවාරි මස 13 වැනි දින පෙ.ව. 9.30 ට,**

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම* : කුලියාපිටිය නගරයේ බස් නැවතුම්පල අසල සිට මාදම්පේ පාර ඔස්සේ මීටර් 450 පමණ දුරක් ගොස් ආනන්දගිරි ගාර්ඩ්න් පාර හංදිය දක්වා පැමිණ දකුණුපසට ඇති එම මාර්ගයට හැරී මීටර් 300 ක් පමණ දුරක් ගිය විට අදාළ දේපළ මාර්ගයේ වම්පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* : සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

01. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
02. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% ක් (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්),
04. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000/-,
05. ලිපිකරු හා සෝෂක වේතන රු. 1,500/-,
06. සියලුම ප්‍රචාරක වියදම්,
07. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද සමඟ වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

*අතිකුත් තොරතුරු සඳහා විමසන්න* :

කළමනාකරු,
නීති දෙපාර්තමේන්තුව,
නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී.,
අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.
දුරකතන අංකය : 011 4218742.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

එම්. එච්. ටී. කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු සහ
උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකතන අංක : 011 3068185, 011 2572940.

01 - 383

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - බේරුවල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී විසින් මහබදුගේ ප්‍රමාප් දිල්සර ප්‍රනාන්දු ජයසූරිය සහ කලවිල පතිරණගේ හිරුණි රංගිකා වෙත ප්‍රදානය කරන සංවර්ධන ණය පහසුකම් ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි වාසියට කළුතර ප්‍රසිද්ධ නොතාරිස් වයි. එන්. පී. ද සිල්වා විසින් .ලියා සහතික කරන ලද 2018.12.17 දිනැති අංක 2470 දරන සහ 2020.06.22 දිනැති අංක 2805 දරන උකස් බැඳුම්කරය මගින් මහබදුගේ ප්‍රමාප් දිල්සර ප්‍රනාන්දු ජයසූරිය සහ කලවිල පතිරණගේ හිරුණි රංගිකා ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ අයවිය යුතු ණය මුදල්, සියලු ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම වියදම් මුදල් අයකර ගැනීම සඳහා, මෙහි පහත සඳහන් දේපළ, හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින්,

**2024 පෙබරවාරි 19 වැනි දින පෙ.ව. 9.30 ට,**

දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, දකුණු කළුතර තොමුණ මග්ගොන් බද්දේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 747 ඒ - මරක්කලහාවත්ත ග්‍රාම නිලධාරී වසම මරක්කලහාවත්තේ පිහිටි ගලබොඩලන්ද නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. ලියනගේ විසින් සාදන ලද අංක 161/2017 සහ 2017 ජූනි 01 දින දරන පිඹුරේ ලොට් 5 ඒ දරන ඉඩම ප්‍රමාණයෙන් පර්චස් විසි තුනයි දශම නවයයි බිංදුවක් (පර්. 23.90) හෝ හෙක්ටයාර් 0.0605ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පලතුරු, සෑම සියලු දේ ද වේ.

*වැඩි විස්තර සඳහා.* - 2023.11.24 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2023.12.04 මව්බිම, ඩේලිමිරර් සහ තිනකුරල් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - බේරුවල පිහිටි එච්. එන්. බී බැංකුවේ සිට කොළඹ (ඒ2) මාර්ගයේ කිලෝ මීටර් 1 1/2 පැමිණ, මග්ගොන මරක්කලවත්ත හේන පාරට පිවිස, එකී මරක්කලවත්ත පාරේ මීටර් 400 ක් පමණ දුර යන විට වයි හන්දියක් ඇති අතර, එතැන් සිට අඩි 15 ක් පළල පාර දිගේ මීටර් 300 ක් යන විට විෂයගත දේපළ පාරට මුහුණලා වම් අත පැත්තේ පිහිටා ඇත.
*ගෙවීමේ ක්‍රමය :*

(01) ගැණුම් මිලෙන් 10% ක් ද,
(02) පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ද,
(03) වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද,
(04) ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 2,000/- ක් ද,
(05) විකුණුම් වියදම් සමඟ වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
(06) විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද,

ගැණුම් මිලෙන් 90% ක් වූ මුදල විකුණුම් දින සිට 30ක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී, හි ප්‍රධාන කළමනාකරු (අය කිරීම්), හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10 ලිපිනය වෙත ගෙවිය යුතුය.
දුරකතන අංක : 011-2661866, 011-2661828.

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30) ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සාම විනිසුරු (මුළු දිවයිනටම).

අංක 11/55, බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකතන අංක : 011-2053286, 072-3207533, 076-9217329.

01 -391

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - ජා ඇල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීමයි

හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී විසින් බේලියෝ (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කරන ලද සංවර්ධන ණය පහසුකම් ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි වාසියට ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් දෙකම ලියා සහතික කරන ලද 2015.09.23 දිනැති අංක 11959 දරන සහ 2018.04.10 දිනැති අංක 13631 දරන සහ ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් ලියා සහතික කරන ලද 2022.10.20 දිනැති අංක 627 උකස් බැඳුම්කරය මගින් බේලියෝ (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් සහ ලද්දූ විනිතා මානෙල් ද සිල්වා යන අය ණයකරු ලෙස පැහැර හැර ඇති බැවින් සහ බැඳුම්කරය යටතේ අයවිය යුතු ණය මුදල්, සියලු ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම වියදම් වූ මුදල් අයකර ගැනීම සඳහා, මෙහි පහත සඳහන් දේපළ,

හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින්,

**2024 පෙබරවාරි 16 වැනි දින පෙ.ව. 9.30 ට,**

දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ජා-ඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 192 - තුඩැල්ල දකුණ ග්‍රාම නිලධාරී වසම තුළ විජය පාර, තුඩැල්ලේ පිහිටි මූණමලගහවත්ත කොටස නැමති ඉඩම බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් සාදන ලද 2020 මාර්තු මස 21 දින පිටසනක් කරන ලද අංක 7580 සහ 2003 පෙබරවාරි 19 දින දරන පිඹුරේ ලොට් 07 දරන ඉඩම ප්‍රමාණයෙන් පර්චස් අටක් (පර්. 8) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි, ඇතුලුව සැම සියලු දේ ද වේ.

*වැඩි විස්තර සඳහා.* - 2023.09.15 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද 2023.10.02 මව්බිම, ඩේලිමිරර් සහ තිනකුරල් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - ජා-ඇල නගර මධ්‍යයේ සිට මීගමුව පාර දිගේ මීටර් 200 ක් පමණ පාලම පසුකර ලංකා බැංකු පරිශ්‍රයෙන් ඔබ්බට අධිවේගී මාර්ගයට සහ බෝපිටියට යන නව මාර්ගයට වමට හැරී මීටර් 100 ක් පමණ ඉදිරියට ගොස්, ඉන්පසු දකුණට හැරී විජය පාරට මීටර් 75 ක් පමණ ඉදිරියට ගිය විට 2 වන වංගුවේ දකුණු පැත්තේ ඉදිරිපසින් ඉඩම හමු වේ.

*ගෙවීමේ ක්‍රමය :*

(01) ගැණුම් මිලෙන් 10% ක් ද,
(02) පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ද,
(03) වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද,
(04) ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 2,000/- ක් ද,
(05) විකුණුම් වියදම් සමඟ වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
(06) විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද,

ගැණුම් මිලෙන් 90% ක් වූ මුදල විකුණුම් දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී, වෙත ගෙවා නිම කළ යුතුයි. ප්‍රධාන කළමනාකරු (අය කිරීම්), හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10 ලිපිනය වෙත ගෙවිය යුතුය. දුරකතන අංක : 011-2661866, 011-2661828.

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30) ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සාම විනිසුරු (මුළු දිවයිනටම).

අංක 11/55, බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකතන අංක : 011-2053286, 072-3207533, 076-9217329.

01 - 392

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - පිළියන්දල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී විසින් හේවා මද්දුම ගෙතාච්චිගේ අජිත් ප්‍රේමලාල් වෙත ප්‍රදානය කරන ලද කෙටිකාලීන ණය පහසුකම ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි වාසියට පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්ලිව්. පෙරේරා විසින් ලියා සහතික කරන ලද 2022.04.29 දිනැති අංක 6971 දරන උකස් බැඳුම්කරය මගින් හේවා මද්දුම ගෙතාච්චිගේ අජිත් ප්‍රේමලාල් ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ අයවිය යුතු ණය මුදල්, සියලු ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම වියදම් මුදල් අයකර ගැනීම සඳහා, මෙහි පහත සඳහන් දේපළ, හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින්,

**2024 පෙබරවාරි 15 වැනි දින පෙ.ව. 9.30 ට,**

දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ නගර සභා සීමා තුළ අංක 566 - දම්පේ ග්‍රාම නිලධාරී වසම තුළ දම්පේ පිහිටි කැකුණගහලන්ද *හෙවත්* කැකුණගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ඩී. හෙට්ටිගේ විසින් සාදන ලද අංක 2940 සහ 1994 ජූලි 07 දින දරන පිඹුරේ ලොට් 55 දරන ඉඩම ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම දෙකයි පහක (පර්. 10.25) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පලතුරු, සැම සියු දේ සහ බලයලත් මිනින්දෝරු ඩී. ඩී. හෙට්ටිගේ විසින් සාදන ලද අංක 2940 සහ 1994 ජූලි 07 දින දරන පිඹුරේ දක්වෙන ලොට් 67 සහ 13 වශයෙන් ලකුණු කරන ලද හා බලයලත් මිනින්දෝරු ඩී. ඩී. හෙට්ටිගේ විසින් සාදන ලද අංක 2940 සදහ 1994 ජූලි 07 දින දරන පිඹුරේ දක්වෙන ලොට් 67 සහ 13 වශයෙන් ලකුණු කරන ලද හා බලයලත් මිනින්දෝරු ඩී. ඩී. හෙට්ටිගේ විසින් සාදන ලද අංක 2929 සහ 1994 මැයි 20 දින දරන පිඹුරේ දක්වෙන ලොට් 04 ලකුණු කරන ලද පාර සඳහා වෙන් කිරීම මතින් වන මාර්ග අයිතිය ද සමඟ වේ.

*වැඩි විස්තර සඳහා.* - 2023.11.24 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද 2023.12.06 මව්බිම, ඩේලිමිරර් සහ තිනකුරල් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - පිළියන්දල නගරයේ සිට මොරටුව පාරේ සුවාරපොල හන්දිය දක්වා කිලෝමීටර් 1.5 ක් පැමිණ වමට හැරී දොම්පේ පාරට පිවිස, එතැන් සිට කිලෝ මීටර් 2.3 ක් " බෝධිය" තෙක් පැමිණ එතැනින් දකුණට හැරී දොම්පේ ගමට පිවිසෙන මාර්ගයට පැමිණ, කිලෝ මීටර් 2 ක් පමණ ආසන්න වශයෙන් ගමන් කිරීමේදී ටී. එන්. එල් පාර පසුකර යන විට දකුණු අත පැත්තේ පිහිටි ලේක් ඩ්‍රයිව් වෙතට ළඟා විය හැකිය. එතැනින් ආසන්න වශයෙන් මීටර් 60 ක් පමණ පැමිණ දකුණට හැරී, ද ෆිනෑන්ස් සමාගමේ ඉඩම් කැබැලි කර විකිණීමේ ලේක් ඩ්‍රයිව් නිවාස වෙත පැමිණ එතැන් සිට මීටර් 150 ක් පමණ දුර යන විට අඩි 20 පළල ග්‍රැවල් පාරක් දකුණු දෙසට වැටී ඇති අතර ඒ ඔස්සේ මීටර් 40 දුරින් පාරට යාබදව වම් පසට වන්නට මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය :*

(01) ගැණුම් මිලෙන් 10% ක් ද,
(02) පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ද,
(03) වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද,
(04) ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 2,000/- ක් ද,
(05) විකුණුම් වියදම් සමඟ වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
(06) විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද,

ගැණුම් මිලෙන් 90% ක් වූ මුදල විකුණුම් දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී, වෙත ගෙවා නිම කළ යුතුයි. ප්‍රධාන කළමනාකරු (අය කිරීම්), හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10 ලිපිනය වෙත ගෙවිය යුතුය.

දුරකතන අංක : 011-2661866, 011-2661828.

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30) ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සාම විනිසුරු (මුළු දිවයිනටම).

අංක 11/55, බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකතන අංක : 011-2053286, 072-3207533, 076-9217329.

01 - 393

**සණස ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී - කෑගල්ල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම.

කෑගල්ල ප්‍රසිද්ධ නොතාරිස් ගයනී එස්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද 2018.10.19 දිනැති අංක 260 දරන සණස ඩිවෙලොප්මන්ට් බැන්ක් පීඑල්සී නමින් වූ බැඳුම්කරය යටතේ කුරුප්පු රාළලාගේ දිල්හාන් මංජුල *හෙවත්* කුරුප්පු රාල්ලගේ දිල්හාන් මංජුල සහ ලියනගේ රූපා දමයන්ති ලියනගේ යන බන්ධනදායින් වශයෙන් සණස ඩිවෙලොප්මන්ට් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

(1) සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළේ, ගම්දොලහ පත්තුවේ ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ගලිගමුව ප්‍රාදේශීය සභා සීමාවේ අංක 74 D පානකව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පානකව ග්‍රාමයේ පිහිටි "රඹුක්පදුරේ හේන රත්මලගහමුලහේන සහ උඩකුඹුරේ පිල්ලෑව" ලෙස හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු ආර්. කේ. නිස්සංක විසින් සාදන ලද 2018.08.30 දිනැති අංක 2819 දරන පිඹුරේ ලොට් 01 ලෙස බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් පහත පරිදි වේ. උතුරට : අංක 5994 A දරන පිඹුරේ ලොට් 06 සහ ගල්කොටුවේ හේනද, නැගෙනහිරට : ගල්කොටුවේ හේන සහ අංක 5994 A දරන පිඹුරේ ලොට් 08 ද, දකුණට : අංක 5994 A දරන පිඹුරේ ලොට් 13 (පිවිසුම) බටහිරට : අංක 5994 A දරන පිඹුරේ ලොට් 13 (පිවිසුම් අංක 5994 A දරන පිඹුරේ ලොට් 06 යන මෙකී මායම් තුළ පිහිටි පර්චස් දහයයි දශම පහයි බිංදුවක් (පර්. 10.50) *හෙවත්* හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි දෙකයි හයයි පහයි හයක් (හෙක්ටයාර් 0.02656) විශාල ඉඩම එහි පිහිටි ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියලුම දේ සමග සහ බලයලත් මිනින්දෝරු සී. කේ. බැද්දේවෙල විසින් සාදන ලද 1997.06.23 දිනැති අංක 5994 A දරන පිඹුරේ ලොට් 13, ලොට් 22 සහ ලොට් 37, දරන ඉඩම් මතින් මාර්ග අයිතියද සමග වේ.

ඉහත කී අංක 2819 දරන සැලැස්මේ ලොට් 01 පහත සඳහන් ඉඩමේ නැවත මැනීමක් වේ.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළේ, ගම්දොලහ පත්තුවේ ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ගලිගමුව ප්‍රාදේශීය සභා සීමාවේ අංක 74 D පානකව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පානකව ග්‍රාමයේ පිහිටි "රඹුක්පදුරේ හේන, රත්මල්ගහමුලහේන සහ උඩකුඹුර පිල්ලෑව" ලෙස හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු සී. කේ. බැද්දෙවෙල විසින් සාදන ලද 1997.01.23 වඩාත් නිවැරදිව 1997.06.23 දිනැති අංක 5994 A දරන පිඹුරේ ලොට් 07 ලෙස දක්වා බෙද වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් පහත පරිදි වේ. උතුරට : ලොට් 06 සහ ගල්කොටුවේහේනද, නැගෙනහිරට : ලොට් 08 සහ ගල්කොටුවේ හේන ද, දකුණට : ලොට් 08 සහ ලොට් 13 ද, බටහිරට : ලොට් 06 සහ ලොට් 13 යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහයයි දශම පහයි බිංදුවක් (පර්. 10.50) විශාල ඉඩම එහි පිහිටි ගහකොළ වැවිලි සහ අනෙකුත් සියලුම දේ සමග සහ බලයලත් මිනින්දෝරු සී. කේ. බැද්දවෙල

විසින් සාදන ලද 1997.06.23 දිනැති අංක 5994 A දරන පිඹුරේ ලොට් 13, ලොට් 22 සහ ලොට් 37 දරන ඉඩම් කොටස් මතින් මාර්ග අයිතියද සමග වේ. (මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්‍රිරුව J118/133 යටතේ ලියාපදිංචි කර ඇත.

(2) සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළේ, ගම්දොලහ පත්තුවේ, ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ගලිගමුව ප්‍රාදේශීය සභා සීමාවේ අංක 74 D පානකව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පානකව ග්‍රාමයේ පිහිටි "රඹුක්පඳුරේහේන රත්මල්ගහමුලහේන සහ උඩකුඹුරේ පිල්ලෑව" ලෙස හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු ආර්. කේ. නිස්සංක විසින් සාදන ලද 2018.08.30 දිනැති අංක 2820 දරන පිඹුරේ ලොට් 01 ලෙස දක්වා බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් පහත පරිදි වේ. උතුරට : ගල්කොටුවෙහේනද, නැගෙනහිරට : කොච්චියාගේ කැබැල්ල ද, දකුණට : අංක 5994 A දරන සැලැස්මේ ලොට් 09 ද, බටහිරට : අංක 5994 A (පිවිසුම) දරන සැලැස්මේ ලොට් 07 සහ ලොට් 13 (පිවිසුම) ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහයයි දශම පහයි බිංදුවක් (පර්. 10.50) විශාල *හෙවත්* හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි දෙකයි හයයි පහයි හයක් (හෙක්ටයාර් 0.02656) විශාල ඉඩම එහි පිහිටි ගහකොළ, වැව්ලි ඇතුළුව අනෙකුත් සියලුම දේ සමග සහ බලයලත් මිනින්දෝරු සී. කේ. බැද්දේවෙල විසින් සාදන ලද 1997.06.23 දිනැති අංක 5994 A දරන පිඹුරේ ලොට් 13, ලොට් 22 සහ ලොට් 37, දරන ඉඩම් කොටස් මතින් මාර්ග අයිතිය ද සමග වේ.

ඉහත කී අංක 2820 දරන සැලැස්මේ ලොට් 01 පහත සඳහන් ඉඩමේ නැවත මැනීමක් වේ.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළේ, ගම්දොලහ පත්තුවේ, ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ගලිගමුව ප්‍රාදේශීය සභා සීමාවේ අංක 74 D පානකව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පානකව ග්‍රාමයේ පිහිටි "රඹුක්පඳුරේ හේන, රත්මල්ගහමුලහේන සහ උඩකුඹුරේ පිල්ලෑව" ලෙස හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු සී. කේ. බැද්දෙවෙල විසින් සාදන ලද 1997.06.23 දිනැති අංක 5994 A දරන සැලැස්මේ ලොට් 08 ලෙස දක්වා බෙද වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් පහත පරිදි වේ. උතුරට : ලොට් 07 සහ ගල්කොටුවෙහේන ද, නැගෙනහිරට : කොච්චියාගේ කැබැල්ලද, දකුණට : ලොට් 09 සහ ලොට් 13 ද, බටහිරට : ලොට් 13 සහ ලොට් 07 යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහයයි දශම පහයි බිංදුවක් (පර්. 10.50) විශාල *හෙවත්* හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි දෙකයි හයයි පහයි හයක් (හෙක්ටයාර් 0.02656) විශාල ඉඩම එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැව්ලි සහ අනෙකුත් සියලුම දේ සමග සහ බලයලත් මිනින්දෝරු සී. කේ. බැද්දේවෙල විසින් සාදන ලද 1997.06.23 දිනැති අංක 5994 A දරන පිඹුරේ ලොට් 13, ලොට් 22 සහ ලොට් 37, දරන ඉඩම් කොටස් මතින් මාර්ග අයිතිය ද සමග වේ. (මෙය, කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්‍රිරුව J118/134 යටතේ ලියාපදිංචි කර ඇත. ඉහත සඳහන් දේපළ,

**2024 පෙබරවාරි මස 16 වන දින පස්වරු 1.30 ට,**

එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කෑගල්ල නගරයේ සිට කොළඹ පාර ඔස්සේ කි.මී. 1 ක පමණ දුරක් ගොස් රංවල හංදිය දක්වා පැමිණ දකුණුපසට ඇති පොල්ගහවෙල පාරට හැරී තවත් කි.මී. 0.75 ක පමණ දුරක් ගිය විට වම්පසින් පිහිටි පානකව පාරට හැරෙන්න. එම මාර්ගය දිගේ තවත් මීටර් 300 ක පමණ දුරක් ගොස් දකුණු පසට පිහිටි තිර දමූ මාර්ගයට හැරී මීටර් 200 ක පමණ දුරක් ගියවිට අදාළ දේපළ පිහිටා ඇත. කෑගල්ල නගරයට කි.මී. 2 ක පමණ දුරකින් පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම* :- 2023.12.08 වන දිනැති රජයේ *ගැසට් පත්‍රයේ* සහ 2023.12.07 වන දින දිවයින, ද අයිලන්ඩ්, සහ තිනකුරල් පුවත්පත්වල පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය* :- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% ක් (සියයට එකයි) වන පළාත් අධිකාරී බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5% (සියයට දෙකහමාරක්)
4. විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා නොතාරිස් ගාස්තු රුපියල් 3000/=,
5. ලිපිකරු සහ සෝෂක වේතන රුපියල් 2000/=,
6. සියලුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරියද,

ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරුබදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතුය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න* :

අංශ ප්‍රධානි, (ණය අයකර ගැනීම් සහ එකතු කිරීම්),
සණස ඩිවෙලොප්මන්ට් බැන්ක් පීඑල්සී,
අංක 12, එඩ්මන්ටන් පාර, කිරුළපන, කොළඹ 06.
දු. ක. : 011-2832500, 011-2832647.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

එම්. එච්. ටී. කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දු. ක. : 011 - 3068185, 011 - 2572940.

01 - 378

**සණස ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. - කටුවන ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මාතර ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩබ්ලිව්. එන්. ඩී. කුමාරි විසින් ලියා සහතික කරන ලද 2019.08.21 වැනි දිනැති අංක 587 දරන සණස ඩිවෙලොප්මන්ට් බැන්ක් පීඑල්සී නමින් වූ බැඳුම්කරය යටතේ තිබ්බොටුව දෙණිය කංකානම්ගේ ප්‍රමිත් කුමාර දර්ශන යන අය බන්ධනදායී වශයෙන් සණස ඩිවෙලොප්මන්ට් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, උතුරු ගිරුවා පත්තුවේ, ඔකේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වීරකැටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ, මොදරවාන දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මොදරවනා ග්‍රාමයේ පිහිටි "කන්දවත්ත ටී. පී. අංක 352046" ලෙස හඳුන්වනු ලබන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : ටී. පී. 282134, $120^{C4}$, සහ 112 ද, නැගෙනහිරට : ලොට් 112 ද, දකුණට : ලොට් 113 ද, බටහිරට : ලොට් 114 ද යන මායිම් තුළ පිහිටි (ඉඩම් හරහා ඇති අඩි පාර හැර) අක්කර තුනයි, පර්චස් විසිපහයි (අ. 3, පර්. 25) විශාල ඉඩම එහි පිහිටි ගහකොළ, වැවිලි ඇතුළු අනෙකුත් සියලු දේ සමග වේ. මෙය තංගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කොට්ඨාසය, වෙළුම/පත්‍රිරුව J 38/80 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් ඉඩම බලයලත් මිනින්දෝරු ජේ. පී. එන්. ජයසුන්දර විසින් 2018.07.14 වැනි දින නැවත මැන පිඹුරු අංක 14563 ලෙස දක්වා පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, උතුරු ගිරුවා පත්තුවේ, ඔකේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වීරකැටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ, මොදරවාන දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මොදරවනා ග්‍රාමයේ පිහිටි "කන්දවත්ත (ටී. පී. 352046)" ලෙස හඳුන්වනු ලබන (සර්වේයර් ජනරාල් විසින් සාදන ලද FVP 264 ලොට් $114^{A}$ හි නැවත මැනීමක් වන) බලයලත් මිනින්දෝරු ජේ. පී. එන්. ජයසුන්දර විසින් සාදන ලද 2018.07.14 දිනැති අංක 14563 දරන පිඹුරේ ලොට් A ලෙස දක්වා බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් $120^{E}$, $120^{C4}$ සහ 112 ද, නැගෙනහිරට : ලොට් 112 සහ පාරට (ප්‍රා.සභා), දකුණට : ලොට් 112 සහ පාර ද (ප්‍රා.ස.), බටහිරට : ලොට් 114 $120^{E}$ සහ $120^{C4}$ යන මායිම් තුළ පිහිටි අක්කර තුනයි, පර්චස් විසිදෙකයි දශම හතක් (අ.3, පර්.22.7) විශාල ඉඩම එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි ඇතුළු අනෙකුත් සියලුම දේ සමග වේ. ඉහත සඳහන් දේපළ වර්ෂ,

**2024 ක් වූ පෙබරවාරි මස 19 වැනි දින පෙ.ව. 11.00ට,**

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ වෙත පිවිසීම* - වලස්මුල්ල නගරයේ සිට බෙලිඅත්ත පාර ඔස්සේ කි.මී. 6ක පමණ දුරක් ගොස් ඔකේවෙල හන්දිය දක්වා පැමිණ වම්පසට ඇති මුල්ගිරිගල පාරට හැරී තවත් කි.මී. 1.5ක පමණ දුරක් ගොස් වම්පස පිහිටි තවදුව පාරට හැරී මීටර් 500ක් පමණ දුරක් ගියවිට අදාළ දේපළ මාර්ගයේ වම් පසින් පිහිටා ඇත.

යෝජනා සම්මුතිය සඳහා : 2023.10.06 වැනි දිනැති *රජයේ ගැසට්* පත්‍රයේ සහ 2023.10.06 වැනි දින දිවයින, ද අයිලන්ඩ් සහ තිනකුරල් යන පුවත්පත්වල පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය* : සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% ක් (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5% (සියයට දෙකහමාරක්),
4. විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා නොතාරිස් ගාස්තු රු. 3,000/-,
5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 2,000/-,
6. සියලුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වේතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න* : අංශ ප්‍රධානී, (ණය අයකර ගැනීම් සහ එකතු කිරීම්) සණස ඩිවෙලොප්මන්ට් බැන්ක් පීඑල්සී, අංක 12, එඩ්මන්ටන් පාර, කිරුළපන, කොළඹ 06.

දුරකථන අංක : 011 - 2832500, 011 - 2832647.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

එම්. එච්. ටී. කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොලොන්නාව.
දුරකතන අංකඃ 011-3068185, 011-2572940.

01 - 379

### සෙලාන් බැංකුව පී. එල්. සී. - බොරැල්ල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපළ දෙදෙනාම දෙහිවල පදිංචි හාජා මොහිදීන් සයිපුල් අක්රාම් සහ මොහොමඩ් රිසාන් පතිමා රිම්සා යන අය බන්ධනදායීන්/උකස්කරුවන් වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව වෙත සුරක්ෂිත කර ඇත.

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, ඔය පළාත කෝරළේ, නුවරඑළිය මහ නගර සභා සීමාව තුළ සහ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මහගස්තොට 535ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මහගස්තොට පිහිටි බලයලත් මිනින්දෝරු ගාමිණි බී. දොඩන්වෙල විසින් සාදන ලද 2016 මාර්තු 07 දිනැති අංක 11530 දරන සැලැස්මේ නිරූපනය වන මූන් ප්ලේන්ස් ඩිවිෂන් ඔෆ් මහගස්තොට එස්ටේට් නමැති ඉඩමේ ලොට් 27ඒ ලකුණු කළ (බලයලත් මිනින්දෝරු ගාමිණි බී. දොඩන්වෙල විසින් සාදන ලද 2012 දෙසැම්බර් 06 දිනැති අංක 9323 සැලැස්මේ සඳහන් එකතු කළ ලොට්ස් 27, 28, සහ 29 හි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට එකී අංක 11530 දරන සැලැස්ම අනුව පර්චස් විස්සයි දශම හතයි පහක් (පර්. 20.75) විශාල ස්ටෝනි ක්‍රොෆ්ට් නමැති කොටසක් ඉදිකරන ලද නිවාස.

පහත සඳහන් මාර්ගය සඳහා වෙන්කිරීම් උඩින්, තුළ සහ දිගේ මාර්ග අයිතීන් සහ වෙනත් අදාළ හිමිකම් සමග.

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, ඔය පළාත කෝරළේ, නුවරඑළිය මහ නගර සභා සීමාව තුළ සහ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මහගස්තොට 535ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මහගස්තොට පිහිටි බලයලත් මිනින්දෝරු ගාමිණි බී. දොඩන්වෙල විසින් සාදන ලද 2012 දෙසැම්බර් මස 06 වැනි දිනැති අංක 9323 දරන සැලැස්මේ නිරූපනය වන මූන් ප්ලේන්ස් ඩිවිෂන් ඔෆ් මහගස්තොට එස්ටේට් නමැති ඉඩමේ ලොට් ආර් 2, ආර් 3, ආර් 4 සහ ආර් 5 (පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස් එකී අංක 9323 දරන සැලැස්ම අනුව ආර් 2 රූඩ් එකයි පර්චස් හතරයි දශම නවයයි හතරක් (රූ.1, පර්.4.94) ආර් 3 පර්චස් දහනවයයි දශම හතරයි පහක් (පර්. 19.45) ආර් 4 පර්චස් හතයි දශම අටයි හතරක් (පර්. 7.84) සහ ආර් 5 රූඩ් එකයි පර්චස් හතරයි දශම පහයි පහක් (රූ.1, පර්. 4.55) විශාල ඉඩම් සහ පහත විස්තර කරනු ලබන නේචර් ස්ට්‍රිප්ස් (ස්වභාවික තීරුව) සහ ජොගිං ට්‍රැක් (ව්‍යායාම් පථ).

පෙර කී පරිදි මහගස්තොට පිහිටි බලයලත් මිනින්දෝරු ගාමිණි. බී. දොඩන්වෙල විසින් සාදන ලද 2012 දෙසැම්බර් 06 දිනැති අංක 9323 දරන සැලැස්මේ නිරූපනය වන මූන් ප්ලේන්ස් ඩිවිෂන් ඔෆ් මහගස්තොට එස්ටේට් නමැති ඉඩමේ ලොට් පී1, පී 2, පී 3, පී 4, පී 5, පී 6, පී 7, පී 8 (නේචර් සිට්‍රිප්ස් (ස්වභාවික තීරුව) සහ ජොගිං ට්‍රැක් (ව්‍යායාම් පථ) ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස් එකී අංක 9323 දරන සැලැස්ම අනුව පී 1, පර්චස් එකයි දශම දෙකයි තුනක් (පර්.1.23), පී 2 පර්චස් අටයි දශම එකයි පහක් (පර්. 8.15), පී 3 පර්චස් දහසයයි දශම දෙකයි හතක් (පර්. 16.27). පී 4 පර්චස් බිංදුවයි දශම තුනයි දෙකක් (පර්. 0.32), පී 5 පර්චස් පහයි දශම හතයි නවයක් (පර්.5.79), පී 6 පර්චස් එකොළහයි දශම හතරයි හයක් (පර්. 11.46), පී 7 පර්චස් දහනවයයි දශම එකයි හතරයි (පර්. 19.14) සහ පී 8 පර්චස් දහයයි දශම හතරයි තුනක් (පර්. 10.43) විශාල ඉඩම් ඉහත සඳහන් දේපළ,

**2024 පෙබරවාරි මස 21 වැනි දින පෙ.ව. 09.30ට,**

සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03 දරන ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ වෙත පිවිසීම.*- නුවරඑළිය නගරයේ සිට උඩ පැස්සැල්ල පාර ඔස්සේ කි. මී. 3ක පමණ දුරක් ගොස් දකුණුපසට ඇති මහගස්තොට වත්තට යන පාරට පිවිසී තවත් මීටර් 900ක පමණ දුරක් ඉදිරියට පැමිණ දකුණුපසට ඇති මූන් ප්ලේන්ස් පාරට හැරී තවත් මීටර් 500ක පමණ දුරක් ගියවිට සංවර්ධනය කරන ලද ලිට්ල් ඉංග්ලන්ඩ් කොටේජස් නමැති දේපළ හමුවේ.

*යෝජනා සම්මුතිය සඳහා* : 2021.02.12 වැනි දින *රජයේ ගැසට්* පත්‍රය ද, අද, ඩේලිමිරර් සහ ටැමිල් මිරර් යන පුවත්පත් වල 2020.12.07 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය* : සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% ක (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්),
4. නොතාරිස් ගාස්තු, විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000,
5. ලිපිකරු හා සෝෂක වේතන රු. 2,000,
6. සියලුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : නීති ප්‍රධානී, සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක : 011 2456479, 2456481

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච් ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොලොන්නාව.
දුරකතන අංක 011-3068185, 011-2572940

01 - 382

---

## ඩී එෆ් සී සී බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණුම් නිවේදනය

ඩීඑෆ්සීසී බැන්ක් පී.එල්.සී. (ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී හි අනුප්‍රාප්තික) නමට ප්‍රසිද්ධ නොතාරිස් සිරිපාල රණතුංග විසින් ලියා සහතික කරන ලද 2015.06.30 වැනි දිනැති අංක 3399, 2014.06.27 වැනි දිනැති අංක 3046 දරන උකස් බැඳුම්කරය සහ උකස් බැඳුම්කරයන් මත අයවිය යුතු ගෙවීම් කිරීම, හබරණ පදිංචි දිසානායක මුදියන්සේලාගේ උපාලි දිසානායක ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ අයවිය යුතු ණය මුදල්, සියලු ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුලු සියලුම වියදම් මුදල් අයකර ගැනීම සඳහා, මෙහි පහත සඳහන් දේපළ සහ මෝටර් රථ. ඩීඑෆ්සීසී බැන්ක් පී.එල්.සී. වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින්,

**2024 පෙබරවාරි මස 26 වැනි දින පෙ.ව. 11.30ට,**

දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පලුගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කැකිරාව ප්‍රාදේශීය සභා බලසීමාව තුළ 589, හබරණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මාතොඹුව කෝරළේ, හබරණ ගමේ පිහිටි, සර්වේ ජනරාල්වරයා විසින් සාදන ලද අවසන් ගම් පිඹුරු 848 හි ලොට් 705 වශයෙන් දක්වෙන හබරණ මූකලාන ගොඩ ඉඩම ප්‍රමාණයෙන් හෙක්ටයාර බිංදුවයි දශම තුනයි බිංදුවයි තුනයි හයක් (හෙ. 0.3036) විශාල ඉඩම සහ එහි පිහිටි සියලු දේ ද සමග වේ.

*මෝටර් රථ*

| *ලියාපදිංචි අංකය* | *විස්තරය, නිෂ්පාදනය, වර්ගය, අශ්වබල ආදිය* | *චැසි අංකය* | *එන්ජින් අංකය* | *තබා ඇති ස්ථානය* |
|---|---|---|---|---|
| 226-5450 | නිසාන් ඩීසල් මෝටර් ලොරිය | CM87BE-47448 | FE6-130745B | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 29, සුසිරිගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හබරණ, පොළොන්නරුව පාරේ උපාලි මෙටල් ක්‍රෂර් |

| *ලියාපදිංචි අංකය* | *විස්තරය, නිෂ්පාදනය, වර්ගය, අශ්වබල ආදිය* | *චැසි අංකය* | *එන්ජින් අකය* | *තබා ඇති ස්ථානය* |
|---|---|---|---|---|
| 270-1783 | කොබෙල්කෝ 510 ලෑන්ඩ් වෙහිකල් | RL04074 | 4BDI-T953117 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 29, සුසිරිගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හබරණ, පොළොන්නරුව පාරේ උපාලි මෙටල් ක්‍රෂර් |
| NC GP-7767 | මැසේ ෆර්ගියුසන් 240 කෘෂිකාර්මික නොවන ලෑන්ඩ් වෙහිකල් | 2773D40114 | CE31215U 953948A | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 29, සුසිරිගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හබරණ, පොළොන්නරුව පාරේ උපාලි මෙටල් ක්‍රෂර් |

ඊට සම්බන්ධ සියලුම උපාංග සහ උපකරණ ද සමග වේ.

*වැඩි විස්තර සඳහා :* 2023.12.01 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* ද, 2023.11.21 වැනි දින දිවයින, ද අයිලන්ඩ් පුවත්පත්වල හා 2023.11.22 වැනි දින තිනකුරල් පුවත්පතේ පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම :-* හබරන හන්දියේ සිට මඩකලපුව පාරේ මීටර් 200ක් පමණ පැමිණ වම් පැත්තේ ඇති ග්‍රැවල් පාරේ මීටර් 50ක් පැමිණි විට පාරෙ වම් අත පැත්තට වන්නට මෙම විෂය දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය :*

1. ගැණුම් මිලෙන් 10% ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 2,000/ක් ද,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද,

ගැණුම් මිලෙන් සියයට අනූවක් (90%) ක් වූ මුදල විකුණුම් දින 30ක් ඇතුළත ඩීඑෆ්සීසී බැන්ක් පී.එල්.සී. වෙත ගෙවා නිම කළ යුතුයි. අයකර ගැනීම් සහ පුනරුත්තාපන අංශය, ඩීඑෆ්සීසී බැන්ක් පී.එල්.සී., අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02. දුරකථන අංකය : 0112371371

*හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.*

ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30) ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සාමවිනිසුරු (මුළු දිවයිනටම)

අංක 11/55,
බෝගහවත්ත, කුඩාබුත්ගමුව,
අංගොඩ.
දුරකථන අංක : 011 2053286/072 3207533/076 9217329

01 - 394

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (HDFC බැංකුව)

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

ණය අංකය : 101730000007
ණයකරුවන්ගේ සම්පූර්ණ නම් : මාදම්පෙ මිල්ස් (පුද්) සමාගම සහ උඩගම ලියනගේ සමන් දමයන්ති

(මෙහි මින් මතු) "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 සහ 2011 අංක 45 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබූ 2023.12.29 වැනි දින අංක 2365 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2023.12.29 වැනි දින "දිනමිණ", "ඩේලි නිව්ස්" සහ "තිනකරන්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 134, බැද්දගාන පාර, කෝට්ටේ ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති විසින්

**2024 පෙබරවාරි මස 16 වැනි දින ප.ව. 2.00**

සිට පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී හෝ HDFC බැංකුව කොළඹ ශාඛා පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

අංක 3483 උකස්කරය සහ අංක 4405 ප්‍රතිව්‍යුහගතකරණ ඔප්පුව යටතේ රුපියල් අසූතුන් මිලියන එකසිය තිස් අටදාස් නවසිය පනස් එකයි ශත තිස් හතක (රු. 83,138,951.37) මුදලක් වර්ෂ 2023.10.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(01) ණය අංකය - 101730000007
එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් විසිහය මිලියන විසිහත්දාස් හැටපහයි ශත හතලිස් හයක (රු. 26,027,065.46) මුදල ද වර්ෂ 2023.10.31 වන දින දක්වා හිඟ මුදල වශයෙන් රුපියල් පනස් හත් මිලියන එකසිය එකොළොස්දහස් අටසිය අසූපහයි ශත අනූ එකක් (රු. 57,111,885.91) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් අසූ තුන් මිලියන එකසිය තිස් අටදාස් නවසිය පනස් එකයි ශත තිස්හතක් (රු. 83,138,951.37) ද,

(02) එකී ණය මුදලෙ හි ආපසු නොගෙ වූ මුදලවන රුපියල් විසිහය මිලියන විසිහත්දාස් හැටපහයි ශත හතලිස් හයක (රු. 26,027,065.46) මුදල මත අයවිය යුතු වර්ෂයකට 22.82% ක පොළිය 2023.11.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(03) 2023.11.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව)ඉහත කී ණය මුදලට අදාළ සම්පූර්ණ හිඟ මුදල්වන රුපියල් හතලිස්තුන් මිලියන දෙසිය හැට හයදාස් අටසිය පනස් තුනයි ශත පනස් පහක (රු. 43,266,853.55) මුදල මත මාසිකව 1.67% ක ප්‍රමාද පොළියක් අයකර ගැනීම සඳහා ද,

(04) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකල හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි (කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත 2011 අංක 1 හා 2011 අංක 19 දරන පනත යටතේ පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ **2023 ක් වූ නොවැම්බර් මස 28** වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

01. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, සීතාවක ප්‍රාදේශීය සභා සීමාවේ සහ සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 429 A හිඟුරල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වේරළුපිටිය සහ හිඟුරල ග්‍රාමයන් හි පිහිටි වේරළුපිටිය එස්ටේට් නැමති ඉඩමට 2010.03.22 දින යූ. කේ. ජී. පී. එස්. පුෂ්පකුමාර මානක තැන විසින් මැන සම්පාදිත අංක 1652 පිඹුර ප්‍රකාර කැබලි අංක A ට මායිම්, උතුරට : පාර (පිඹුරු අංක 662 හි කැබලි අංක 90), පාර (පිඹුරු අංක 662 හි කැබලි අංක 92) සහ පිඹුරු අංක 662 හි කැබලි අංක 84 ද, නැගෙනහිරට : පිඹුරු අංක 662 හි කැබලි අංක 84, පාර (පිඹුරු අංක 662 හි කැබලි අංක 92) පිඹුරු අංක 662 හි කැබලි අංක 94 සහ කැබලි අංක E සහ B ද, දකුණට : පිඹුරු අංක 662 හි කැබලි අංක 94 සහ පිඹුරු අංක 662 හි කැබලි අංක 65බී සහ පාර ද, බටහිරට : පිඹුරු අංක 662 හි කැබලි අංක 54, පිඹුරු අංක 662 හි කැබලි අංක 56 සහ පිඹුරු අංක 662 හි කැබලි අංක 60 යන මායිම් තුළ පිහිටි අක්කර දහනවයයි රූඩ් තුනයි සහ පර්චස් දහනවයයි දශම හයයි දෙකක (අක්. 19, රූඩ්. 3, පර්. 19.62) *හෙවත්* හෙක්ටයාර් 8.0422 වපසරියකින් යුතු මෙම ඉඩම අවිස්සාවේල්ල ඉඩම්

ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 167/67 හි ලියාපදිංචි කර ඇත.

02. බස්නාහිර පළාතේ, ඉහත කී වේරළුපිටිය සහ හිඟුරල ග්‍රාමයන්හි පිහිටි වේරළුපිටිය එස්ටේට් නැමති ඉඩමට 2010.03.22 දින යූ. කේ. ජී. පී. එස්. පුෂ්පකුමාර මානක තැන විසින් මැන සම්පාදිත අංක 1652 පිඹුර ප්‍රකාර කැබලි අංක C ට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : පිඹුරු අංක 662 හි කැබලි අංක 84, පිඹුරු අංක 1012 හි කැබලි අංක 2 ද, දකුණට : පාර ද, බටහිරට : පාර (පිඹුරු අංක 662 හි කැබලි අංක 92) යන මායිම් තුළ පිහිටි පර්චස් එකොළහක (පර්. 11) *හෙවත්* හෙක්ටයාර් 0.0278 වපසරියකින් යුතු මෙම ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 163/76 හි ලියාපදිංචි කර ඇත.

03. බස්නාහිර පළාතේ, ඉහත කී වේරළුපිටිය සහ හිඟුරල ග්‍රාමයන්හි පිහිටි වේරළුපිටිය එස්ටේට් නැමති ඉඩමට 2010.03.22 දින යූ. කේ. ජී. පී. එස්. පුෂ්පකුමාර මානක තැන විසින් මැන සම්පාදිත අංක 1652 පිඹුර ප්‍රකාර කැබලි අංක D ට මායිම්, උතුරට : පාර (පිඹුරු අංක 662 හි කැබලි අංක 92) ද, නැගෙනහිරට : පාර සහ පිඹුරු අංක 662 හි කැබලි අංක 87 හි ඉතිරි කොටස ද, දකුණට : පිඹුරු අංක 662 හි කැබලි අංක 87 හි ඉතිරි කොටස ද, බටහිරට : පාර (පිඹුරු අංක 662 හි කැබලි අංක 92) යන මායිම් තුළ පිහිටි පර්චස් විස්සයි දශම පහක (පර්. 20.50) *හෙවත්* හෙක්ටයාර් 0.0518 වපසරියකින් යුතු මෙම ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 163/71 හි ලියාපදිංචි කර ඇත.

04. බස්නාහිර පළාතේ, ඉහත කී වේරළුපිටිය සහ හිඟුරල ග්‍රාමයන්හි පිහිටි වේරළුපිටිය එස්ටේට් නැමති ඉඩමට 2010.03.22 දින යූ. කේ. ජී. පී. එස්. පුෂ්පකුමාර මානක තැන විසින් මැන සම්පාදිත අංක 1652 පිඹුර ප්‍රකාර කැබලි අංක E ට මායිම්, උතුරට : ටෙරන්ස් පෙරේරා හිමිකම් කියන ඉඩම (පිඹුරු අංක 662 හි කැබලි අංක 84) ද, නැගෙනහිරට : ටෙරන්ස් පෙරේරා හිමිකම් කියන ඉඩම (පිඹුරු අංක 662 හි කැබලි අංක 84), පිඹුරු අංක 1651 හි කැබලි අංක 5 B සහ පාර පිඹුරු අංක 662 හි කැබලි අංක 87 හි ඉතිරි කොටස ද, දකුණට : පිඹුරු අංක 662 හි කැබලි අංක 97 B සහ පිඹුරු අංක 1618 හි කැබලි අංක 7 හි ඉතිරි කොටස ද, බටහිරට : කැබලි අංක A, පිඹුරු අංක 662 හි කැබලි අංක 94 සහ පිඹුරු අංක 662 හි කැබලි අංක 92 යන මායිම් තුළ පිහිටි අක්කර එකොළහයි රූඩ් දෙකයි පර්චස් බිංදුවයි දශම හතයි දෙකක (අක්. 11, රූඩ්. 2, පර්. 0.72) *හෙවත්* හෙක්ටයාර් 4.6557 වපසරියකින් යුතු මෙම ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 163/77 හි ලියාපදිංචි කර ඇත.

05. බස්නාහිර පළාතේ, ඉහත කී වේරළුපිටිය සහ හිඟුරල ග්‍රාමයන්හි පිහිටි වේරළුපිටිය එස්ටේට් නැමති ඉඩමට 2010.03.20 දින යූ. කේ. ජී. පී. එස්. පුෂ්පකුමාර මානක තැන විසින් මැන සම්පාදිත අංක 1651 පිඹුර ප්‍රකාර කැබලි අංක 5B ට මායිම්, උතුරට : ටෙරන්ස් පෙරේරා හිමිකම් කියන ඉඩම (පිඹුරු අංක 662 හි කැබලි අංක 84) ද, නැගෙනහිරට : හිඟුරල ඇළ, දකුණට : පිඹුරු අංක 662 හි කැබලි අංක 97 B ද, බටහිරට : කැබලි අංක 5A, යන මායිම් තුළ පිහිටි අක්කර එකොළහයි සහ පර්චස් තිස්තුනයි දශම හතරයි හයක (අක්. 11, පර්. 33.46) *හෙවත්* හෙක්ටයාර් 4.5361 වපසරියකින් යුතු මෙම ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 163/75 හි ලියාපදිංචි කර ඇත.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් මිහිරි ආර්. එස්. ප්‍රනාන්දු විසින් 2016.09.09 දින ලියා සහතික කරන ලද අංක 3483 දරන උකස්කරය අනුව මෙහි දක්වා ඇති උපලේඛනය පරීක්ෂා කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සාමාන්‍යාධිකාරී.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව,
ජාතික නිවාස සංවර්ධන අධිකාරී ගොඩනැගිල්ල,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත.
තැ. පෙ. 2085,
කොළඹ - 02.

01 - 459

---

## සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

බිනාල් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ගිණුම් අංකය : 0075 1000 0001

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2023.10.26 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පහළොස් කෝටි හතලිස් පන් ලක්ෂ විසි එක් දහස් දෙසිය විසි එකයි ශත තිස් එකක (රු. 154,521,221.31) මුදල ද, 2023 අගෝස්තු 22 දින සිට අංක 3388 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හත් කෝටි පනස් ලක්ෂයක (රු. 75,000,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම දෙකයි පහක් (16.25%) හා තවත් රුපියල් එක් කෝටි අනූ හත් ලක්ෂ තිස් එක් දහස් පන්සිය හැට පහයි ශත අසූ අටක (රු. 19,731,565.88) මුදලක් සඳහා වාර්ෂිකව සියයට හයයි දශම නවයයි තුනක් (6.93%) හා තවත් රුපියල් එක් කෝටි අසූ

ලක්ෂයක (රු. 18,000,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම දෙකයි පහක් (16.25%) හා තවත් රුපියල් දෙකෝටි දොළොස් ලක්ෂ දහ අට දහස් හයසිය අසූ අටයි ශත හතලිස් නවයක (රු. 21,218,688.49) මුදලක් සඳහා වාර්ෂිකව සියයට හයයි දශම නවයයි තුනක් (6.93%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වේනොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2023.11.24 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* සහ 2023.12.04 ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි,

**2024.02.20 දින, ප.ව. 2.30 ට,**

පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන එන්. යූ. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, වාද්දු වස්කඩු දෙබැද්ද, පානදුර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ පානදුර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, මොල්ලිගොඩ (අංක 704) දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ මොල්ලිගොඩ ග්‍රාමයේ පිහිටි ගාලු පාර, වරිපනම් අංක 790/15 සහ 790/16 දරන බලයලත් මානක තැන වයි. බී. කේ. කොස්තා යන අය විසින් සාදන ලද 2006.09.14 දින හා අංක 3664 දරන පිඹුරේ නිරූපිත (කොරටුවේවත්ත *නොහොත්* කොටුවේවත්ත හි ලොට් 1A සහ 1B සහ කොරටුවේවත්ත *නොහොත්* කොටුවේවත්ත හි 1/3 කොටස, කොරටුවේවත්ත *නොහොත්* කොටුවේවත්ත හි තවත් කොටසක් සහ කොරටුවේවත්ත *නොහොත්* කොටුවේවත්ත හි 2/3 කොටස කහටගහවත්ත (කොටසක්) යයි කියනු ඉඩම්වල බෙදූ කොටස ඒකාබද්ධ ඉඩම වශයෙන් සීමා නිර්ණය කොට ඇති) සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : කහටගහවත්ත හි කොටසක්, නැගෙනහිරට: අංක 3664 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 2 සහ 3 සහ වර්තමානයේ තුන්වන පටුමග, දකුණට : ලොට් 2 සහ බුලුගහවත්ත සහ බස්නාහිරට: දන් දුම්රිය දෙපාර්තමේන්තුවට අයිති මූදිල්ලගහවත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් තිස් හතරයි දශම පහයි බිංදුවක් (අ. 1, රූ. 2, පර්. 34.50) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 3664 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව D 372/109 යටතේ පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

01 - 405

**ලංකා බැංකුව, හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී, මහජන බැංකුව හා සම්පත් බැංකුව පී.එල්.සී**

වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සහ 2000 අංක 54 දරන පනතින් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ ලංකා බැංකුව විසින් විකිණීම පිළිබඳ දැන්වීම.

2011 අංක 01 සහ 2011 අංක 19 දරන පනතින් සංශෝධිත 1990 අංක 09 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැංකුව විසින් විකිණීම පිළිබඳ දැන්වීම.

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුව විසින් විකිණීම පිළිබඳ දැන්වීම.

2011 අංක 01 සහ 2011 අංක 19 දරන පනතින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ සම්පත් බැංකුව විසින් විකිණීම පිළිබඳ දැන්වීම.

රත්මලාන, මාළිගාව පාරේ අංක 30 හි ට්‍රයි ස්ටාර් ඇපරල් එක්ස්පෝර්ට් (පුද්ගලික) සමාගමේ ණය වගකීම් වෙනුවෙන් රත්මලාන, නෙළුම්පුර පිටත මාළිගාව පාර, 02 වන පටුමගෙ හි පිහිටි උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017.02.03 දිනැති ගැසට් පත්‍රයේ හා 2017.01.20 දිනැති "ඩේලිනිවුස්", " දිනමිණ" හා "තිනකරන්" යන පුවත්පත් වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියට අනුකූලව,

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීම පිළිබඳ (විශේෂ විධිවිධාන) පනත මගින් පවරා ඇති බලය යටතේ හැටන් නැෂනල් බැංකුව (පී.එල්.සී) හි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016.10.21 දිනැති සහ 2016.11.04 දිනැති *ගැසට් පත්‍රවල* ද 2016.10.10 දිනැති ඩේලිමිරර් සහ 2016.11.08 දිනැති දිනපතා ලක්බිම සහ තිනකුරල් පුවත්පත්වල පළ වූ යෝජනා සම්මුතිය ද,

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29 ඩී වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017.02.17 දිනැති ගැසට් පත්‍රයේ සහ 2017 පෙබරවාරි 03 දිනැති ඩේලිනිවුස් සහ පිළිවෙලින් 2017 පෙබරවාරි 06 සහ 2017.02.07 දිනැති දිනමිණ සහ තිනකරන් යන පුවත්පත් වල පළවූ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.09.26 දින පැවති රැස්වීමක දී ඒකමතිකව සම්මත කළ යෝජනා සම්මුතිය ද,

එමෙන්ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017.02.17 දිනැති ගැසට් පත්‍රයේ සහ 2017.02.03 දිනැති "දිවයින", "තිනක්කුරල්" සහ "ද අයිලන්ඩ්" යන පුවත්පත්වල පළ කරන ලද සම්පත් බැංකුව පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2011 අංක 01 සහ 2011 අංක 19 දරන පනතින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීම පිළිබඳ පනතේ (විශේෂ විධිවිධාන) 04 වන වගන්තිය යටතේ සම්මත කර යෝජනා සම්මතයද අනුව මුළු ණය මුදලේ ශේෂය ද විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද ලංකා බැංකු ආඥා පනතේ 26 වන වගන්තිය යටතේ ද, හැටන් නැෂනල් බැංකුව (පී.එල්.සී) හි ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ ද, මහජන බැංකුවේ මහජන බැංකු පනතේ 29 වන වගන්තිය යටතේ සම්පත් බැංකුව පී.එල්.සී හි ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 13 වන වගන්තිය යටතේ ද, මෙහි පහත උපලේඛනවල සඳහන් දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දීම කොළඹ 08, ෆෙයාර්ෆීල්ඩ් ගාර්ඩින්ස්, අංක. 06 ඒ හි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම විසින්

**2024 පෙබරවාරි මස 28 දින පෙ.ව. 11.00 ට**

ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වනු ලැබේ.

**ඉහත සඳහන් උපලේඛන නිශ්වල දේපළ පිළිබඳ විස්තර පහත දැක්වේ**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලෙපත්තුවේ, මොරටුව නගර සභා සීමාවේ, තෙලවල ග්‍රාමයේ නෙලුම්පුර මාළිගාව පාර අසල, 02 වන පටුමගෙ හි පිහිටි ලේඩි කැතරින් ගෘප් නමැති සහ එනමින් ප්‍රසිද්ධ ඉඩමෙහි බලයලත් මිනින්දෝරු ඩී. ජී. එම්. පීටර් ප්‍රනාන්දු විසින් සාදන ලද 1983 සැප්තැම්බර් මස 10 දිනැති අංක 1316 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා විස්තර කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල, එනම් එකී ලොට් 1 උතුරට : මැටි කාණුව (අංක 4430 දරන පිඹුරෙහි ලොට් 4) ද, නැගෙනහිරට : 2 වන පටුමග (කලින් අංක 4430 දරන පිඹුරෙහි ලොට් 11) ද, දකුණට : ලොට් 2 ද, බස්නාහිරට : නෙළුම්පුර පාරේ වරිපනම් අංක 26, 46 සහ 44 (බලයත් මිනින්දෝරු එච්. ඩබ්ලිව්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1962 ජූලි 31 දිනැති අංක 2838 දරන පිඹුරෙහි ලොට් 21 හි කොටස්) මායිම්ව එකී අංක 1316 දරන පිඹුර ප්‍රකාර පර්චස් තිහක (පර්. 30) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2095/189 හි ලියාපදිංචි කර ඇත.

නම් වශයෙන් ලංකා බැංකුව, හැටන් නැෂනල් බැංකුව (පී.එල්.සී), මහජන බැංකුව හා සම්පත් බැංකුව (පී.එල්.සී) යන බැංකු සමූහය වෙනුවෙනි,

*ගෙවීම් කරන ආකාරය.-* වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් සිදු කළ යුතුය.

(01) ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්) ද,
(02) වැට් (VAT) බදු අයකර ගැනීම් ද,
(03) දේශීය විකුණුම් බද්ද ලෙස පළාත් අධිකාරියට 1% (සියයට එකක්) ද,
(04) වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස 2.5% (සියයට දෙකයි දශම පහක්) ද,
(05) විකුණුම් පිරිවැය සහ වෙනත් ගෙවීම්,
(06) ගාස්තු හා වෙනත් අයකර ගැනීම් ද,

වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගැණුම් මිලෙන් තවත් 10% (සියයට දහයක්) ද ගැණුම් මිලෙන් ඉතිරි 80% වෙන්දේසි දිනයේ සිට මාස තුනක් ඇතුළත පියවිය යුතුය. එයට අමතරව විකිණීමේ කොන්දේසි ගිවිසුම සහ විකුණුම් සහතික සඳහා මුද්දර බදු සහ නොතාරිස් ගාස්තු ද ගිණුම්කරු විසින් ගෙවිය යුතුය.

ඉහත දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීමට ගැනුම්කරු අපොහොසත් වන්නේ නම් වෙන්දේසි දිනයේ දී ගෙවන ලද සියලු මුදල් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත විකිණීමේ අයිතිය බැංකුව සතුය.

*දේපළට ප්‍රවේශවන මාර්ගය.* - රත්මලානේ ගාලුපාරේ මැලිබන් හන්දියේ සිට ගාලුපාර දිගේ මොරටුව දෙසට කි.මී.1.9 ක් පමණ ගමන් කර මාලිගාව පාරට වමට හැරී (අඳ හා බිහිරි පාසල් හන්දිය පසු කිරීමෙන් අනතුරුව) මීටර් 900 ක් පමණ ගමන්කර දෙවන පටුමගට දකුණට හැරී මීටර් 75 ක් ගමන් කළ විට දේපළ වෙත ප්‍රවේශ විය හැකිය. ගාලුපාරේ කටුබැද්ද හන්දියේ සිට ගාලුපාර දිගේ රත්මලාන දෙසට කි.මී. 1.2 පමණ ගමන්කර මාලිගාව පාරට දකුණට හැරී ඉහත ආකාරයට ගමන් කිරීමෙන් ද මෙම දේපළ වෙත ප්‍රවේශ විය හැක.

ඉහත දේපළට අදාළ හිමිකම් ඔප්පු හා වෙනත් සම්බන්ධිත ලේඛන අයකර ගැනීම් ආයතනික අංශයේ දී 0112203404 හෝ 0112203409 යන දුරකථන අංකවලින් සම්බන්ධ වී පරීක්ෂා කිරීමට ලංසුකරුවන්ට අවසර ඇත.

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩී. කේ. එස්. එන්. ගුණවර්ධන,
ප්‍රධාන කළමනාකරු,
අයකරගැනීම් - ආයතනික.

ලංකා බැංකුව,
අයකරගැනීම් - ආයතනික අංශය,
3 වන මහළ, ලංකා බැංකු චතුරශ්‍රය, අංක 01,
ලංකා බැංකු මාවත,
කොළඹ 01.

01 - 427

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.